# විදර්ශන සාහිත්‍ය ත්‍යාගය - 2025 සඳහා
# අත්පිටපත් භාරගැනීම ඇරඹේ

2025 වසරේ පැවැත්වෙන 'විදර්ශන සාහිත්‍ය ත්‍යාගය' සඳහා නිර්මාණ අත්පිටපත් භාරගැනීම **2024 නොවැම්බර් 01 දා සිට 2025 මාර්තු 31 දක්වා** සිදු කෙරේ.

මෙවර පැවැත්වෙන්නේ දෙවන 'විදර්ශන සාහිත්‍ය ත්‍යාගය' වන අතර සාහිත්‍යාංග 05 දක්වා මෙවර එය පුළුල් කර තිබේ. ඒ අනුව

1. **නවකතා**
2. **කෙටිකතා සංග්‍රහ**
3. **කාව්‍ය සංග්‍රහ**
4. **පරිවර්තන ඉංග්‍රීසි**
5. **පරිවර්තන සිංහල**

යන අංශ යටතේ අත්පිටපත් ඉදිරිපත් කළ හැකිය.

අත්පිටපත් ඇගයුම් ක්‍රියාවලිය අදියර 3කින් යුතු වන අතර පළමු අදියරේදී ඉදිරිපත් වන අත්පිටපත් අතරින් දිගුලැයිස්තුගත කිරීමක් සිදු වේ. දෙවන අදියරේදී නම් 3න් යුත් කෙටි ලැයිස්තුව ප්‍රකාශයට පත් කෙරේ. ඒ අතරින් '**විදර්ශන ජයමූර්තිකාව**' හිමිවන අත්පිටපත තෝරා ගැනේ.

ජයමූර්තිකාලාභී අත්පිටපත තෝරාගන්නා තෙක් එම නිර්මාණකරුවන්ගේ නම් විනිශ්චය මණ්ඩල වෙත නිරාවරණය නොකිරීම විදර්ශන සාහිත්‍ය ත්‍යාගයේ විශේෂත්වයයි.

ඒ ඒ සාහිත්‍යාංග යටතේ ප්‍රශස්තම අත්පිටපත සඳහා 'විදර්ශන ජයමූර්තිකාව' සහ **රු. 150000/ ක මුදල් ත්‍යාගයද** කෙටි ලැයිස්තුගත අත්පිටපත් සඳහා **රු. 50000/- බැගින් මුදල් ත්‍යාගද** හිමි වේ.

Fm Abhaya 12 ප්‍රමාණයේ හෝ Unicode අකුරින් යතුරුලියනය කොට පිටු අංකනය කළ මුද්‍රිත අත්පිටපත් හෝ PDf පිටපත් ලෙස හෝ මේ සඳහා නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.

විදර්ශන සාහිත්‍ය ත්‍යාග අයදුම්පත්‍රය, විස්තර පත්‍රිකාව සහ වැඩිදුර තොරතුරු www.vidarshanalitprize.com සහ Vidarshana Literary Prize ෆේස්බුක් පිටුවෙන් ලබාගත හැකිය.

2025 අගෝස්තු මාසයේදී ජයමූර්තිකා ප්‍රදාන උළෙල පැවැත්වේ.

වැඩිදුර විමසීම්:

දුර - 0112765024

Whatsapp - 0762059581